සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - කොළඹ අධ්‍යාපන කලාපය
மேல் மாகாணக் கல்வித் திணைக்களம் - கொழும்பு கல்வி வலயம்
Western Provincial Education Department - Colombo Educational Zone

දෙවන වාර ඇගයීම - 2016
இரண்டாம் தவணை மதிப்பீடு - 2016
**Second Term Evaluation - 2016**

| 11 ශ්‍රේණිය<br>தரம் 11<br>Grade 11 | කෘෂි හා ආහාර තාක්ෂණය I පත්‍රය<br>வினாத்தாள்-1<br>Agri and Food Technology- Paper I | පැය එකයි<br>ஒரு மணித்தியாலம்<br>One Hour |
|---|---|---|

සැලකිය යුතුයි:
(1) සියලු ම ප්‍රශ්නවලට උත්තර සපයන්න.
(2) අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල, දී ඇති (1),(2),(3),(4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

---

## කෘෂි හා ආහාර තාක්ෂණය I

1. අඹන් ගඟ හරස්කර ඉදිකළ ඇළහැර අමුණ හැරවීමෙන් ඇළහැර ඇල ඔස්සේ ජලය ලබා දෙන්නේ,
   (1) පරාක්‍රම සමුද්‍රයට හා කන්තලේ වැවටයි.
   (2) මින්නේරිය වැවට හා කන්තලේ වැවටයි.
   (3) කලා වැවට හා ගිරිතලේ වැවටයි.
   (4) ගිරිතලේ වැවට හා කන්තලේ වැවටයි.

2. හරිත විප්ලවය සමඟ කෘෂිකර්මාන්තයේ සිදුවූ වෙනස්කම් වනුයේ,
   (1) කෘෂි රසායන භාවිතය අඩුවීම
   (2) ගොවිපල යාන්ත්‍රිකරණය අඩුවී මිනිස් ශ්‍රමය වැඩිවීම
   (3) එළවළු මිල ඉහළයාම
   (4) කෙටිකලක් තුල වැඩි අස්වනු ලබාදෙන බීජ වර්ග හඳුන්වාදීම

3. ආහාර සුරක්ෂිතතාවය කෙරෙහි බලපාන සාධක වනුයේ,
   (1) ආහාර සුලභතාවය, ප්‍රවේශ වීමේ හැකියාව, ආහාර අපතේ යාම
   (2) ප්‍රයෝජනයට ගැනීම, ආහාර සුරක්ෂිතතාවය, ආහාර හිඟ වීම
   (3) ආහාර සුලභතාවය, ප්‍රවේශ වීමේ හැකියාව, ප්‍රයෝජනයට ගැනීම
   (4) ප්‍රවේශ වීමේ හැකියාව, ආහාර හිඟ වීම , ආහාර අපතේ යාම

4. ලංකාවේ වාසුළි වැසි ඇතිවීමට වැඩි ප්‍රවණතාවයක් ඇත්තේ,
   (1) දෙසැම්බර් මාසයේය.
   (2) ජනවාරි මාසයේය.
   (3) මැයි මාසයේය.
   (4) අගෝස්තු මාසයේය.

5. පාංශු වාතය සම්බන්ධයෙන් වැරදි ප්‍රකාශය තෝරන්න.
   (1) පාංශු වාතය පාංශු ජීවීන්ගේ ශ්වසනයට උපකාරී වේ.
   (2) පාංශු වාතය ශාක මුල්වලට අවශ්‍ය වාතය ලබා දෙයි.
   (3) පාංශු ඛාදනය වැළැක්වීමට පාංශු වාතය උපකාරී වේ.
   (4) පාෂාණ ජීර්ණයට අවශ්‍ය කාබනික අම්ල සෑදීමට ආධාර වේ.

6. පාංශු ජනනය යන්නෙන් අදහස් කරන්නේ,
   (1) පාෂාණ රසායනිකව ජීර්ණය වීමයි.
   (2) මාතෘ ද්‍රව්‍ය වලින් පස ඇතිවීමයි.
   (3) පාංශු ඛාදනයෙන් පස වෙනත් ස්ථානයක තැන්පත් වීමයි.
   (4) පාෂාණවලින් මාතෘ ද්‍රව්‍ය ඇතිවීමයි.

7. වැඩෙන පරිසරය අනුව බෝග වර්ගීකරණයේදී ශුෂ්ක පරිසරයේ වැවෙන බෝග කාණ්ඩය වනුයේ,
(1) තල, කුරක්කන්, බඩඉරිඟු (2) අඹ, පොල්, බෝංචි
(3) පෙයාර්ස්, ස්ට්‍රෝබෙරි, මල්ගෝවා (4) වී, කොහිල, කංකුන්

8. ශාක වර්ගීකරණය නිසා සිදුවන වාසියක් නොවන්නේ,
(1) වගා කන්න අනුව උචිත බෝග තෝරා ගැනීම පහසු වීම
(2) වල්නාශක තෝරා ගැනීමට පහසු වීම
(3) බෝග පාලන කටයුතු කිරීමට පහසු වීම
(4) බෝග අස්වැන්නේ මිල තීරණය කිරීමට පහසු වීම

9. මිනිස් බලයෙන් පමණක් ක්‍රියාකරන බිම් සැකසීමේ උපකරණ ඇතුලත් පිළිතුර තෝරන්න.
(1) සැහැල්ලු යකඩ නගුල, උදැල්ල, තැටි නගුල (2) උදැල්ල, උදලු මුල්ලුව, රේක්කය
(3) තැටි නගුල, රේක්කය, රිජරය (4) රිජරය, උදැල්ල, තල පෝරුව

10. බෝග වගාවේදී ප්‍රධාන වශයෙන් පසෙන් ජලය ඉවත් වන්නේ,
(1) ශාකවල උත්ස්වේදනය සිදු වීමෙනි. (2) පසෙන් ජලය ක්ෂීරණය වීමෙනි.
(3) පසෙන් ජලය වාෂ්පීකරණය වීමෙනි.
(4) ශාකවල උත්ස්වේදනය සහ පසෙන් ජලය වාෂ්පීකරණය වීමෙනි.

11. උප පෘෂ්ඨීය ජල සම්පාදන ක්‍රම වන්නේ,
(1) මැටි කළ මගින් හා සවිවර නළ මගින් ජලය යෙදීමය.
(2) සවිවර නළ හා විසුරුම් ක්‍රමයෙන් ජලය යෙදීමය.
(3) බිංදු ජල සම්පාදනය හා භූගත ජල සම්පාදනයයි.
(4) විසුරුම් ක්‍රමය හා බිංදු ජල සම්පාදනයයි.

12. පසෙන් ශාකයට ලබාගත හැකි ජල ප්‍රමාණය වැඩි කර ගැනීමට පසට කළයුතු ප්‍රතිකර්ම හෝ ප්‍රතිකර්මයන් වන්නේ,
(1) පසට කාබනික ද්‍රව්‍ය එකතු කිරීමය. (2) පසට වසුන් යෙදීමය.
(3) ආවරණ බෝගයක් වගා කිරීමය. (4) ඉහත සියල්ලමය.

13. වී වගාවේ මතුපිට පොහොර ලෙස යොදා ගැනෙන බන්ඩි පොහොරවල අඩංගු මූලද්‍රව්‍ය මොනවාද?
(1) N හා K පමණි. (2) N හා P පමණි.
(3) P හා K පමණි. (4) ඉහත කිසිවක් නොවේ.

14. වල්පැලෑටිවල රූපාකාරය අනුව පත්‍ර සිහින් දිගැටි නාරටි සමාන්තර පත් වර්ග වලට උදාහරණ වන්නේ,
(1) මොනරකුඩුම්බිය, කුප්පමේනිය, ඇපල (2) තුනැස්ස, කුන්හිරියා, කුඩමැට්ට
(3) බටදැල්ල, ඇටවරා, ඉලුක් (4) දියහබරල, ජපන් ජබර, මාරුක්

15. "කෙසෙල් ශාකයක පත්‍ර සෙච්චන්දියක ආකාරයෙන් දිස්විය." මෙය කුමන රෝගයක ලක්ෂණයක්ද?
(1) වටපණු රෝගයකි. (2) දිලීර රෝගයකි.
(3) වෛරස් රෝගයකි. (4) බැක්ටීරියා රෝගයකි.

16. කුකර්බිටේසියේ කුලයේ බෝගවල ඵලය සිදුරු කිරීමෙන් හානිකර ඇත.එසේ සිදු කිරීමට හේතුපාදක වූ කෘමියා කවරෙක්ද?
(1) පුරුක් පණුවා (2) අවුලකපෝරා කුරුමිණියා
(3) එපිලැක්නා කුරුමිණියා (4) ඉල් මැස්සා

17. වී වගාවේදී අස්වනු නෙලීමට සුදුසුම අවස්ථාව වන්නේ,
(1) මෙරු කරල්වලින් 75%ක් රන්වන් පාට වන විටය.
(2) මෙරු කරල්වලින් 80%ක් රන්වන් පාට වන විටය.
(3) මෙරු කරල්වලින් 85%ක් රන්වන් පාට වන විටය.
(4) මෙරු කරල්වලින් 90%ක් රන්වන් පාට වන විටය.

18. වී වගාවේ මූලික බිම් සැකසීමේදී දෙවන හීය පවත්වන්නේ පළමු සී සෑමට දින කීයකට පසුද?
(1) දින 10-12 (2) දින 12-14 (3) දින 14-16 (4) දින 16-18

19. පහත සඳහන් පලිබෝධකයන් අතරින් "කෘමි" ගණයට අයත් නොවන පලිබෝධකයකු වන්නේ,
(1) මයිටාවාය. (2) කීඩෑවාය.
(3) කොළ හකුලන දළඹුවාය. (4) එපිලැක්නාය.

20. බීජ සුප්තතාවය ඉවත් කිරීමට උණුසුම් (45°C - 50°C) ජලයේ දමා ටික වෙලාවක් තබන්නේ පහත සඳහන් කුමන බීජද?
(1) කඩල, කව්පි (2) අඹ, සියඹලා
(3) ඇකේෂියා, ඇහැල (4) තේක්ක, ලුණුමිදෙල්ල

21. ශාක කඳෙහි කක්ෂීය අංකුර හෝ පුෂ්ප අංකුර වලින් හටගන්නා අලිංගික ප්‍රචාරණ ව්‍යුහයකි.
(1) මොරෙයියන් (2) ස්කන්ධ ආකන්ධ
(3) රෛසෝම (4) බල්බිල

22. ශාක සිටුවීමේදී පත්‍ර හෝ පත්‍ර කැබලි මගින් බෝකරගන්නා ශාක වනුයේ,
(1) බතල, මඤ්ඤොක්කා (2) ඇෆ්රිකන් වයලට්, සැන්සිවේරියා
(3) දෙල්, කරපිංචා (4) බෙලි, රෝස

23. මෙම රූප සටහනින් දක්වා ඇත්තේ,
(1) වායව අතු බැඳීමයි.
(2) සංයුක්ත අතු බැඳීමයි.
(3) සරල අතු බැඳීමයි.
(4) රිකිලි බද්ධයයි.



24. මව් ශාකයකින් වෙන් කරගන්නා ලද සක්‍රීය සෛල සමූහයක් අපූතික හා පාලිත පරිසර තත්ත්ව යටතේ විශේෂ රෝපණ මාධ්‍යක වගා කිරීම,
(1) ශාක ප්‍රචාරණයයි. (2) තවාන් කිරීමයි.
(3) පටක රෝපණයයි. (4) වැපිරීමයි.

25. බෝග වගාව සඳහා යොදා ගන්නා ආරක්ෂිත ව්‍යුහ වලින් උෂ්ණත්වය, ආලෝකය, ආර්ද්‍රතාවය, හා සුළඟ යන සියලුම සාධක පාලනය කරන ව්‍යුහය කුමක්ද?
(1) පොලිතින් ගෘහය යි. (2) දැල් ගෘහය යි.
(3) සරල සූර්ය ප්‍රචාරකය යි. (4) හරිතාගාරය යි.

26. නිර්පාංශු වගාවේදී යූරියා භාවිත කිරීමට ඇති අපහසුතාවය වනුයේ,
(1) ශාක අවශෝෂණයට අවශ්‍ය පරිදි බිඳ නොවැටීම ය. (2) යූරියා ජලයේ දිය නොවීම ය.
(3) මාධ්‍ය සංඝටක සමඟ ප්‍රතික්‍රියා කිරීම ය. (4) යූරියාවල අපද්‍රව්‍ය අන්තර්ගත වීම ය.

27. ආහාර පරිරක්ෂණයේ වැදගත් කම වනුයේ,
A - ඉක්මනින් නරක්වන සුළු ආහාර කල් තබා ගත හැකි වීම ය.
B - විවිධ කර්මාන්ත බිහි වීම නිසා රටේ ආර්ථිකය ශක්තිමත් වීම ය.
C - ආහාර විවිධාංගීකරණය වීම ය.
ඉහත ප්‍රකාශ අතරින් සත්‍ය වන්නේ,
(1) A හා B ය. (2) A හා C ය.
(3) B හා C ය. (4) A , B , C සියල්ලම ය.

28. ඝන මාධ්‍ය නිර්පාංශු වගාවේ දී අකාබනික ස්වභාවික මාධ්‍ය සඳහා උදාහරණ වනුයේ,
(1) රොක්වූල් ය. (2) බොරළු ය.
(3) කොහුබත් ය. (4) ලී කුඩු ය.

29. නියමිත කාල වකවානුවක් තුළ යම් භූමියක විවිධ බෝග අනුපිළිවෙලට වගා කර තිබීම හඳුන්වනු ලබන්නේ,
(1) වගා පද්ධතියක් ලෙස ය. (2) වගා රටාවක් ලෙස ය.
(3) වගා ක්‍රමයක් ලෙස ය. (4) වගා ක්ෂේත්‍රයක් ලෙස ය.

30. පසු අස්වනු තාක්ෂණ ක්‍රම භාවිතය පිළිබඳව පහත ප්‍රකාශ සලකා බලන්න.
A - පසු අස්වනු තාක්ෂණ ක්‍රම භාවිතයෙන්, කාලීන හා නරක්වන සුළු බෝග අස්වනු කල්තබා ගත හැකිය.
B - පසු අස්වනු තාක්ෂණ ක්‍රම භාවිතයෙන්, වැඩි අස්වනු අවාරයේදී ප්‍රයෝජනයට ගත හැකි ලෙස ආරක්ෂා කර ගත හැකි ය.
C - පසු අස්වනු තාක්ෂණ ක්‍රම භාවිතය,ආහාර සුරක්ෂිතතාවයට සහ වෙළඳපල මිල පාලනයට උපකාරි වේ.
ඉහත ප්‍රකාශ අතරින් නිවැරදි ප්‍රකාශ වන්නේ,
(1) A හා B ය. (2) A හා C ය.
(3) B හා C ය. (4) A, B හා C සියල්ලම ය.

31. දිනකට සාමාන්‍ය පුද්ගලයෙකුට අවශ්‍ය කාබෝහයිඩ්‍රේට ප්‍රමාණය වන්නේ,
(1) කිලෝ කැලරි 1000 යි. (2) කිලෝ කැලරි 1500 යි.
(3) කිලෝ කැලරි 2000 යි. (4) කිලෝ කැලරි 2500 යි.

32. මිනිසාගේ බුද්ධි වර්ධනය අඩාල වීම, උස යාම සීමා වීම ආදී ඌනතා ලක්ෂණ පෙන්වන්නේ පහත සඳහන් කුමන මූල්ද්‍රව්‍ය හිඟ වූ විටද?
(1) මැග්නීසියම් (2) කැල්සියම්
(3) යකඩ (4) අයඩින්

33. පහත ප්‍රකාශ අතරින් ආහාර නරක් වීම සම්බන්ධව වැරදි ප්‍රකාශය වන්නේ කුමක්ද?
(1) පොල්තෙල් පරණ වීමේදී ඔක්සිකරණ ප්‍රතික්‍රියා නිසා සිදුවන මුඩු වීම ආහාර නරක් වීමක් ලෙස සැලකිය හැකි ය.
(2) නරක් වූ ආහාර මතට ක්ෂුද්‍ර ජීවීන් නිකුත් කරන පරිවෘත්තීය ඵල නිසා ආහාර විෂ විය හැකි ය.
(3) මස් හා මාළු, කරවල වලට වඩා ඉක්මනින් නරක් වේ.
(4) ආහාර නරක් වීම හා සම්බන්ධ දිලීර වර්ග තාප සංවේදී නොවේ.

34. රුධිරයේ සීනි අධික වීම ශ්‍රී ලාංකිකයන් අතර බහුලව දක්නට ලැබෙන රෝගී තත්ත්වයකි. මෙම රෝගී තත්වයෙන් වැළකීමට ආධාර වන ආහාර කාණ්ඩය නම්,
(1) පාන්, පාහින ලද සහල්, මාගරින් (2) අර්තාපල්, බීට්, බතල
(3) කුරක්කන්, පලා වර්ග, මුං ඇට (4) අලිපේර, බනිස්, හකුරු

35. මස් නරක් නොවී කල්තබා ගැනීම සඳහා සුදුසුම පරිරක්ෂණ ක්‍රම අඩංගු පිළිතුර තෝරන්න.
(1) වියළීම, පැස්චරීකරණය හා ලුණු දැමීම (2) අධි ශීත කිරීම, වියළීම හා ලුණු දැමීම
(3) අධි ශීත කිරීම, ලුණු දැමීම හා විසිරි වියළීම (4) පැස්චරීකරණය, අධි ශීත කිරීම හා වියළීම

36. මේදය රහිත කිරිපිටි නිෂ්පාදනයේදී මේදය ඉවත් වීමත් සමඟ මේදයේ දියවන විටමින් වර්ග ද ඉවත් වේ. එම නිසා නැවත විටමින් කිරිපිටි වලට එකතු කිරීම කුමන නමකින් හැඳින්වේද?
(1) සරු කිරීම යි. (2) ප්‍රබල කිරීම යි.
(3) අවම සැකසීම යි. (4) ආමුකුලනය යි .

37. ආහාර පරිරක්ෂණයේ දී ආහාරවල සිදුවන රසායනික වෙනස් කමක් නොවන්නේ,
(1) pH අගය වෙනස් වීම ය. (2) වර්ණය හා හැඩය වෙනස් වීම ය.
(3) පෝෂණීය අගය වෙනස් වීම ය. (4) රසය වෙනස් වීම ය.

38. ශ්‍රී ලංකාවේ ප්‍රථමයෙන් බිහිකළ දෙමුහුම් වී ප්‍රභේදය වන්නේ ,
(1) Bg 300 (2) Bw 351
(3) H 4 (4) Bg 450

39. ශ්‍රී ලංකාවේ සියළු කෘෂි කාර්මික කටයුතු සම්බන්ධීකරණය කිරීමට ක්‍රි.ව. 1822 දී පිහිටුවන ලද්දේ,
(1) පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානය යි. (2) කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යි.
(3) ගන්නොරුව කෘෂි තාක්ෂණ උද්‍යානය යි. (4) වාරි මාර්ග දෙපාර්තමේන්තුව යි.

40. ශ්‍රී ලංකාවේ මධ්‍යම වී අභිජනන මධ්‍යස්ථානය පිහිටුවා ඇත්තේ,
(1) කොළඹ ය. (2) හොරණ ය.
(3) අම්පාර ය. (4) බතලේගොඩ ය.

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - කොළඹ අධ්‍යාපන කලාපය
மேல் மாகாணக் கல்வித் திணைக்களம் - கொழும்பு கல்வி வலயம்
Western Provincial Education Department - Colombo Educational Zone

දෙවන වාර ඇගයීම - 2016
இரண்டாம் தவணை மதிப்பீடு - 2016
Second Term Evaluation - 2016

11 ශ්‍රේණිය
தரம் 11
Grade 11

කෘෂි හා ආහාර තාක්ෂණය II පත්‍රය
வினாத்தாள்-II
Agri and Food Technology- Paper II

පැය දෙකයි
இரண்டு மணித்தியாலங்கள்
Two Hours

පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

---

1. විද්‍යාලයේ පැවැත්වෙන ප්‍රදර්ශනය සඳහා කෘෂි විද්‍යාව හදාරන සිසුන් ශාක ප්‍රචාරණය පිළිබඳ ප්‍රදර්ශන කුටියක් සකස් කරන ලදී. එහි දී ලිංගිකව හා අලිංගිකව ප්‍රචාරණය කරන ශාක නිදර්ශක ඉදිරිපත් කෙරිණි.

(i) (a) ශාකවල ලිංගික ප්‍රචාරණ ව්‍යුහය කුමක් ද?
(b) එහි පවතින වැදගත් ම කොටස කුමක් ද?

(ii) (a) බීජ නිපදවන්නේ නැති ශාකවලින් පැල ලබා ගැනීමට "අතු බැඳීම" සිදු කරයි. අතු බැඳීම යනු කුමක් ද?
(b) අතු බැඳීමේ ප්‍රධාන ක්‍රම දෙක මොනවා ද?

(iii) බීජ ප්‍රරෝහණයට ප්‍රථම සිදු කරන බීජ ප්‍රතිකාර ක්‍රම 2ක් ලියන්න.

(iv) අපිභෞම ප්‍රරෝහණය පෙන්වන ශාක 2ක් ලියන්න.

(v) (a) පළතුරු පැල බද්ධ කිරීම සඳහා බහුලව භාවිත කරන අංකුර බද්ධ ක්‍රම 2ක් ලියන්න.
(b) බද්ධ කිරීම සඳහා භාවිත කරන උපකරණ 2ක් සඳහන් කරන්න.

(vi) බද්ධ කරන ලද පළතුරු පැල සිටුවීම සඳහා සුදුසු තවාන් වර්ගයක් ලියන්න.

(vii) බද්ධ කරන ලද පැල ක්ෂේත්‍රයේ සිටුවීම සඳහා බිම සකස් කළ යුතු ය. ඒ සඳහා සුදුසු උපකරණ 2ක් ලියන්න.

(viii) බෝග වගා කිරීමේදී ක්ෂේත්‍රයේ බෝග සංස්ථාපනය කරන ක්‍රම 2ක් සඳහන් කරන්න.

(ix) ගොඩ බීජ වප්කරය යොදා ගනිමින් සංස්ථාපනය කරන බෝග වර්ග 4ක් ලියන්න.

(x) සහතික කරන ලද බිත්තර වී වල තිබිය යුතු ලක්ෂණ 4ක් ලියන්න.

(ලකුණු 20 )

2. ශ්‍රී ලාංකීය ජනතාවගේ ප්‍රධාන ආහාරය බත් ය. බත සපයනු ලබන්නේ වී ශාකයෙනි. ශ්‍රී ලාංකික ජනතාවගෙන් වැඩි කොටසක් පූර්ණ කාලීනව හෝ අර්ධ කාලීනව වී ගොවිතැනෙහි නිරතවන්නන් වේ.

(i) (a) වී ශාකයේ උද්භිද විද්‍යාත්මක නාමය කුමක් ද?
(b) වී ශාකය අයත් ශාක කුලය ලියන්න.
(c) වී ශාකයේ මුල්, කඳ, පත්‍ර වල රූපීය ලක්ෂණ 2 බැගින් ලියන්න.

(ii) (a) දැනට ශ්‍රී ලංකාවේ පවතින පාරම්පරික වී ප්‍රභේද 3ක් ලියන්න.
(b) වැඩි දියුණු කළ වී ප්‍රභේද වල ලක්ෂණ 3ක් සඳහන් කරන්න.

(iii) වී වගාවට බහුලව වැලඳෙන රෝග 2ක් ලියා එයට හේතුවන රෝග කාරකයා ලියන්න.

(ලකුණු 10)

3. මිනිසාට හෝ මිනිසා විසින් වගා කරනු ලබන බෝග වලට හෝ ඇති කරනු ලබන සතුන්ට හෝ පරිහරණය කරන ද්‍රව්‍ය වලට හෝ හානි පමුණුවන ඕනෑම ජීවියෙක් හෝ වල් පැළෑටියක් පලිබෝධ ලෙස හැදින් වේ.

(i) (a) ආක්‍රමණශීලී වල් පැළෑටියක් යනුවෙන් හඳුන්වන්නේ කුමක් ද?
(b) ඔබ දන්නා ආක්‍රමණශීලී වල් පැළෑටි 2ක නම් ලියන්න.

(ii) (a) වල් පැළෑටි පාලනයේදී යොදා ගන්නා උපාය මාර්ග මොනවාද?
(b) පූර්ව නිර්ගමන වල් පැළෑටි නාශක යන්න හඳුන්වා එය යොදන අවස්ථාව සඳහන් කරන්න.

(iii) (a) භූගත කොටස් සහිත වල් පැළෑටි 2ක් ලියා එම වල් පැළෑටි පාලනයට යෙදිය යුත්තේ කුමන වල් නාශක දැයි දක්වන්න.
(b) ජලජීය වැඩෙන වල් පැළෑටි 2ක නම් ලියන්න.

(ලකුණු 10)

4. ජනගහනය [illegible]වීමත් සමඟ භූමිය සීමාසහිත වූ බැවින් භූමි ඒකකයකින් ලබාගත යුතු බෝග අස්වනු ප්‍රමාණය වැඩිකර ගැ[illegible]මේ උපාය මාර්ග කෙරෙහි ගොවියාගේ අවධානය යොමු විය. මෙහිදී යොදාගත් උපාය මාර්ග වශයෙන් ගොවිතැන් ක්‍රම හා වගා රටා ප්‍රමුඛස්ථානයක් ගනී.

(i) (a) ශ්‍රී ලංකාවේ ගොවීන් අනුගමනය කරනු ලබන ගොවිතැන් පද්ධති 4ක් ලියන්න.
(b) හේන් ගොවිතැනේදී බීජ සිටුවීම හෝ වැපිරීම සිදුකරනු ලබන්නේ කිනම් වකවානුවකද?

(ii) (a) විදි බෝග වගාව පිලිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.
(b) විදි බෝග වගාව සඳහා යොදාගන්නා බෝග වර්ග 2ක නම් ලියන්න.

(iii) (a) සිව් බෝග මාරුවේදී බහුලව යොදාගන්නා බෝග වර්ග 2ක නම් ලියන්න.
(b) කඩින්කඩ වගාවේදී වැටියේ සහ ඇලියේ එකට වගා කළ හැකි බෝග වර්ග 2ක නම් ලියන්න.
(c) පොල් වගාවේ අතුරු බෝගයක් ලෙස වගා කළ හැකි බෝග වර්ග 2ක නම් ලියන්න.

(ලකුණු 10)

5. ගොවිපලක නිෂ්පාදනය වන අස්වැන්න සුරක්ෂිතව පාරිභෝගිකයා අතට පත් කිරීමට අවධානය යොමු විය යුතුය. බෝග නිෂ්පාදනයක පෙර හා පසු අස්වනු හානිය කෙරෙහි, සිදු කරනු ලබන ක්‍රියාකාරකම් සහ වෙනත් තත්ත්ව ද බලපෑම් ඇති කරයි.

(i) (a) පසු අස්වනු හානිය සිදුවිය හැකි අවස්ථා 4ක් ලියන්න.
(b) පසු අස්වනු හානි අවම කිරීම සඳහා පෙර අස්වනු සාධක කළමනාකරණය කිරීම සිදු කරන්නේ කෙසේ ද?
(c) කෘෂි බෝගවල පසු අස්වනු හානිය අවම කිරීම සඳහා රජය මගින් මෑතකදී ගෙන ඇති පියවර මොනවා ද?

(ii) (a) පරිසරයේ සාපේක්ෂ ආර්ද්‍රතාවය වැඩි වීම එළවළු හා පළතුරු අස්වැන්න කෙරෙහි කෙසේ බලපායිද?
(b) වියළි කලාපයේ අර්තාපල් වගාවේදී මහ කන්නයේ වැඩි අස්වැන්නක් ලැබීමට හේතුව කුමක් ද?

(iii) ~~(a) මේරූ අස්වැන්න නෙලීමට භාවිත කරන උපකරණයක රූප සටහනක් ඇඳ කොටස් නම් කරන්න.~~
~~(b) අස්වනු නෙලීමේදී උණුවතුර ප්‍රතිකාරය සිදු කළ යුතු පළතුරු වර්ග 2ක නම් ලියන්න.~~

(ලකුණු 10)

6. මිනිසාගේ වර්ධනය සඳහාත් එදිනෙදා කටයුතු කර ගැනීමට අවශ්‍ය ශක්තිය ලබාගැනීම සඳහා මෙන්ම ගෙවී යන දේහ කොටස් නැවත යථා තත්ත්වයට පත් කර ගැනීම සඳහාත් අමතර පෝෂණය අත්‍යාවශ්‍ය ය.

(i) (a) පෝෂණයේ දී වැදගත් වන පොලිසැකරයිඩ 2ක් ලියන්න.
(b) ලිපිඩ යන ආහාර සංඝටකය කුමන හෝර්මෝන වර්ග සංස්ලේෂණයට වැදගත් වේද?
(c) රක්තහීනතාවය කෙරෙහි බලපාන්නේ කිනම් විටමිනය හිඟ වීමද?

(ii) (a) මැරස්මස් රෝගය ඇතිවන්නේ කුමන වයසේ දරුවන්ටද?
(b) එම රෝගයේ රෝග ලක්ෂණ 2 ක් සඳහන් කරන්න.

(iii) (a) ශරීර ස්කන්ධ දර්ශකය යනු කුමක් ද?
(b) එය ගණනය කිරීම සඳහා යොදාගන්නා සමීකරණය ලියන්න.

(ලකුණු 10)

7. ආහාරයක් පරිභෝජනයට නුසුදුසු තත්ත්වයට පත්වීම හෝ පරිභෝජනය කළ විට ශරීර සෞඛ්‍යයට හානි විය හැකි තත්ත්වයට පත්වීම ආහාර නරක් වීමයි.

(i) (a) ආහාර නරක්වීම කෙරෙහි බලපාන භෞතික සාධක 4ක් ලියන්න.
(b) ආහාරයට විෂ ද්‍රව්‍ය එකතු විය හැකි අවස්ථා මොනවා ද?

(ii) (a) අධි අවදානම් ආහාර යන්න හඳුන්වා ඒ සඳහා උදාහරණ 2 ක් ලියන්න.
(b) මඤ්ඤොක්කා විෂ සහිත වන්නේ කුමන සයනයිඩ් සංයෝගය නිසා ද?

(iii) (a) පළතුරු බිම කල්තබා ගැනීමේදී භාවිත කරනු ලබන පරිරක්ෂක ද්‍රව්‍ය මොනවාද?
(b) ආහාර බිලාන්චිකරණයෙන් බලාපොරොත්තුවන්නේ කුමක් ද?
(c) ආහාර පැස්චරීකරණය කරන ප්‍රධාන ක්‍රම දක්වන්න.

(ලකුණු 10)